**මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - සංරචක 01 - 2025**

----------------------------------------------------------------------------------------------------

මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - සංරචක 01 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2024 ජනවාරි 31 දින එළඹි අංක 7418-LK දරන ණය ගිවිසුමේ 5.01 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ශ්‍රී ලංකා තැන්පතු රක්‍ෂණ අරමුදල නමින් ක්‍රියා කරන ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.
තැන්පතු රක්ෂණ ක්‍රමය කෙරෙහි අවධානය යොමු කරමින්, ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ ආරක්ෂක ජාලයේ මූල්‍ය හා ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. සංරචක 01, සංරචක 02 සහ සංරචක 03 යන සංරචක තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.
ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 46,342 කට සමාන වූ ඇමරිකානු ඩොලර් මිලියන 146 සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි.
ව්‍යාපෘතියේ කටයුතු 2024 ජනවාරි 31 දින ආරම්භ කරන ලද අතර, 2027 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය**

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - සංරචක 01 හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ලැබීම් සහ ගෙවීම් ප්‍රකාශය හා එහි නිර්දේශිත ගිණුමේ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිලිබඳව පාලනය කරණු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 නොවැම්බර් මස නිකුත් කරන ලද, IPF ණය ලබාගන්නන් සඳහා වූ ලෝක බැංකු ප්‍රසම්පාදන රෙගුලාසිවල 4.4 වගන්තියට | එකඟ වූ කාලරාමුවලට අනුව ප්‍රසම්පාදන ප්‍රගතිය පිළිබඳ කාර්තුමය සමාලෝචන පැවැත්වීම, ලෝක බැංකුව වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් | ව්‍යාපෘති ප්‍රමාදයන් වැළැක්වීම සඳහා, අනුමත ප්‍රසම්පාදන සැලැස්මට සහ මූලික කාලරාමුවලට |

| | | | |
|---|---|---|---|
| | (ප්‍රසම්පාදන සැලසුම්කරණය) අනුව, ඵලදායී අධීක්ෂණය සහ නියමිත වේලාවට කාර්යයන් ඉටු කිරීම පහසු කිරීම සඳහා ප්‍රධාන සන්ධිස්ථාන සහ ක්‍රියාත්මක කිරීමේ කාලරාමුන් ඇතුළත් තාත්ත්වික ප්‍රසම්පාදන කාලසටහනක් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීම අනිවාර්ය වේ.<br><br>කෙසේ නමුත්, මුල්‍යා පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතුවල හුවමාරු ක්‍රමානුකූලව අධීක්ෂණය කිරීමේ පද්ධතිය (Systematic Tracking of Exchanges in Procurement - STEP) පරීක්ෂා කිරීමේදී, මුල් සැලසුම්ගත ඉලක්කයන්ට (baselines) සාපේක්ෂව ප්‍රසම්පාදන කටයුතුවල සැලකිය යුතු ප්‍රමාදයක් සිදු වී ඇති බව දක්නට ලැබුණි. එහිදී දින 68 සිට දින 172 දක්වා වූ ප්‍රමාදයන් නිරීක්ෂණය වුණි. තවදුරටත්, තොරතුරු තාක්ෂණ උපදේශක සහ මහජන සන්නිවේදන උපායමාර්ග උපදේශක සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලීන් අනුමත කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග සැලැස්මට අනුකූලව සිදු කර නොතිබුණු අතර, 2025 දෙසැම්බර් 31 වන විටත් ඒවා අසම්පූර්ණව පැවතුණි. | කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා වන උපකාරක මෙහෙයුම් අතරතුර STEP පද්ධතියේ සටහන් කර ඇති ප්‍රසම්පාදන තත්ත්වයන් සමාලෝචනය කිරීම, සහ කාර්තුමය ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම්වලදී ප්‍රසම්පාදන ප්‍රගතිය ඉදිරිපත් කිරීම යන ක්‍රමවේද හරහා ප්‍රසම්පාදන කාලරාමු නිතිපතා අධීක්ෂණය කරන ලද අතර අදාළ පාර්ශවයන් වෙත දැනුම් දෙන ලදී. කෙසේ නමුත්, ආරම්භයේදී පළ කරන ලද පුවත්පත් දැන්වීම් හරහා සුදුසුකම් ලත් උපදේශකයින් හඳුනා ගැනීමට නොහැකි වූ බැවින්, එම උපදේශන පුරප්පාඩු අවස්ථාවන් නැවත දෙවතාවක් ප්‍රකාශයට පත් කිරීමට සිදුවීම හේතුවෙන් මහජන සන්නිවේදන උපායමාර්ග උපදේශක සහ තොරතුරු තාක්ෂණ උපදේශක තේරීමේ කටයුතු සඳහා මුලින් සැලසුම් කිරීමට වඩා වැඩි කාලයක් ගත විය. ලෝක බැංකු ප්‍රසම්පාදන රෙගුලාසිවලට අනුකූලව නියමිත පටිපාටිගත පියවර, නිෂ්කාශනයන් සහ අනුමැතීන් සම්පූර්ණ කිරීමට මෙන්ම තේරීමේ ක්‍රියාවලියේ පාරදෘශ්‍යභාවය, සාධාරණත්වය සහ අඛණ්ඩතාව තහවුරු කිරීමට මෙම අතිරේක කාලය අවශ්‍ය විය. | අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | මුල්‍යා පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ 1 වන සංරචකය යටතේ ඇති කාර්යසාධනය පාදක කරගත් කොන්දේසි (PBCs) ඉටු කර ගැනීම සැලසුම් කළ කාලයට වඩා ප්‍රමාද වී තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මුල් වසර දෙක ඇතුළත ඉටු කර ගැනීමට සැලසුම් කර තිබූ කාර්යසාධනය පාදක කරගත් කොන්දේසි අටෙන්, 2025 | මුල්‍යානය කිරීමේ ගිවිසුම යටතේ මුල් වසර දෙක තුළ කාර්යසාධනය පාදක කරගත් කොන්දේසි (PBCs) අටක් ඉටු කර ගැනීමට සැලසුම් කර තිබුණද, ලබා ඇති තෘප්තිමත් ප්‍රගතිය සලකා බලමින්, 2026 ජනවාරි 12 සිට 21 දක්වා පැවැත්වුණු මධ්‍යකාලීන සමාලෝචන මෙහෙයුමෙන් (Mid-Term Review Mission) පසුව නිකුත් කරන ලද වාර්තාව (Aide Memoire) හරහා | -එම- |

| | | |
|---|---|---|
| | දෙසැම්බර් 31 වන විට සම්පූර්ණයෙන්ම ඉටු කර ගැනීමට හැකිව තිබුණේ පහක් පමණි. ඉතිරි කොන්දේසි තුන ඉටු කර ගැනීමට හැකිව තිබුණේ අර්ධ වශයෙන් පමණක් වන අතර, එහි සාමාන්‍ය ප්‍රගති ප්‍රතිශතය සියයට 62.5 ක් විය.<br><br>විශේෂයෙන්ම, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය (SLDIS) පිළිබඳ මහජන අවබෝධය මිනුම් කිරීම සඳහා සමස්ත ලංකා නියෝජිත සමීක්ෂණයක් පැවැත්වීමට අදාළ PBC 6, 2024 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණද, 2025 දෙසැම්බර් 31 වන විටත් සියයට 95 ක ප්‍රගති මට්ටමක් සහිතව අසම්පූර්ණව පැවතිණි. තවදුරටත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් දීර්ඝකාලීන මහජන සන්නිවේදන උපායමාර්ගයක් අනුමත කිරීම 2025 දෙසැම්බර් 31 වන විට සම්පූර්ණ කළ යුතුව තිබූ අතර, එම දිනය වන විට සියයට 20 ක ප්‍රගතියක් පමණක් ලබාගෙන තිබුණි. | ලෝක බැංකුව විසින් PBC 4, 6 සහ 8 සඳහා වන ඉලක්කගත දින 2026 ජූනි දක්වා සංශෝධනය කරන ලදී.<br><br>ලෝක බැංකුව සහ තැන්පතු රක්ෂණ උපදේශකවරයා සමඟ සාකච්ඡා කර ප්‍රශ්නාවලිය අවසන් කිරීමටත්, නියමු සමීක්ෂණයක් පවත්වා ඒ ඔස්සේ ලැබුණු ප්‍රතිචාර ඇතුළත් කිරීමටත් කාලය ගතවීම නිසා සමස්ත ලංකා නියෝජිත සමීක්ෂණය ප්‍රමාද විය. තවද, සමීක්ෂණයේ ප්‍රතිඵල සමාලෝචනය කිරීමට ලෝක බැංකුවට සහ තැන්පතු රක්ෂණ සහ විසඳුම් දෙපාර්තමේන්තු (DIRD) කණ්ඩායම්වලට අතිරේක කාලයක් අවශ්‍ය වූ අතර, එම අවසාන අදියරේදී පැවැති "දිට්වා" (Dittva) ස්වාභාවික ව්‍යසනය ද සමීක්ෂණය නිම කිරීමට බලපෑම් කළේය.<br><br>2025 ජූලි 16 වන දින ප්‍රකාශයට පත් කරන ලද මුල් ප්‍රසම්පාදනයේදී ඉදිරිපත් වූ සියලුම අභිලාෂය පළකිරීමේ ප්‍රකාශයන් සුදුසුකම් ලැබීමේ නිර්ණායකවලට අනුකූල නොවීම නිසා ප්‍රතික්ෂේප වීමෙන් එය අසාර්ථක වූ බැවින්, දීර්ඝකාලීන මහජන දැනුවත්කිරීමේ උපායමාර්ගයද ප්‍රමාද විය. පසුව, කාර්යය නියමයන් වෙත සංශෝධන එකතු කරමින් 2025 සැප්තැම්බර් 30 වන දින ප්‍රසම්පාදනය නැවත ප්‍රසිද්ධියට පත් කරන ලද අතර, ලංසු ඇගයීමේදී ලංසුකරුවන්ගෙන් පැහැදිලි කිරීම් සහ අතිරේක තොරතුරු ලබා ගැනීම සඳහා අමතර කාලයක් වැය විය. |

**2.2 පද්ධති හා පාලනයන් පිළිබඳ ගැටලු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලෝක බැංකු අරමුදල් මගින් ක්‍රියාත්මක වන මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ කාර්යය නියමයන්හි 04 | ආරම්භයේදී සැලසුම් කර තිබූ 2025 හතරවන කාර්තුව සඳහා වූ 8 වන ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම කල් දමන ලද අතර, | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව එහි කාර්යය නියමයන්හි සඳහන් කර ඇති කාර්තුමය වාර ගණනට දැඩි ලෙස අනුගත විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වන වගන්තියට අනුව, එහි කාර්යභාරයන් ඉටු කිරීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක්වත් රැස්විය යුතුය. කෙසේ වෙතත්, 2025 සැප්තැම්බර් 30 වන දින පැවැත්වුණු රැස්වීමෙන් පසුව කමිටුව රැස්වී ඇත්තේ 2026 පෙබරවාරි 16 වන දින බව හෙළි විය. ඒ අනුව, 2025 වර්ෂයේ හතරවන කාර්තුව සඳහා කිසිදු ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. | 2026 ජනවාරි මාසයේදී පවත්වන ලද ලෝක බැංකුවේ මධ්‍යකාලීන සමාලෝචන මෙහෙයුමෙන් (World Bank's Mid-Term Review Mission) පසුව 2026 පෙබරවාරි 16 වන දින පවත්වන ලදී. මධ්‍යකාලීන සමාලෝචනයට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ ප්‍රධාන සාකච්ඡා ඇතුළත් වූ බැවින්, කමිටු රැස්වීම කැඳවීමට පෙර එම සමාලෝචනයේ ප්‍රතිඵල පිළිබඳව ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව දැනුවත් කිරීම අවශ්‍ය යැයි සලකන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ භාණ්ඩාගාරයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු ව්‍යාපෘති මෙහෙයුම් කමිටු සාමාජිකයින්ගේ පවතින කාර්යබහුලත්වය හේතුවෙන් අතිරේකව රැස්වීම් කාලසටහන්ගත කිරීමට නොහැකි විය. මෙම සංශෝධිත වැඩපිළිවෙල ලෝක බැංකුව වෙත දැනුම් දී ඒ සඳහා එකඟතාව ලබා ගන්නා ලදී. | |
| (ආ) | මුදල් ප්‍රකාශනවල වාර්තා කර ඇති ණය ශේෂයන් මහාභාණ්ඩාගාර වාර්තා සමඟ සැසඳීම සහ ඒවායේ එකඟතාව තහවුරු කිරීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) වගකීමක් වුවද, මහාභාණ්ඩාගාර වාර්තා සමඟ එම ශේෂයන් සැසඳීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. තවද, XDR මගින් දක්වා ඇති ණය ශේෂයන් මහාභාණ්ඩාගාර වාර්තා සමඟ එකඟ වන බව දක්නට ලැබුණද, ඊට අදාළ රුපියල් වටිනාකම්වල ශේෂයන්හි සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය විය. ඊට අනුකූලව, 2025 දෙසැම්බර් 31 වන විටත් රුපියල් මිලියන 1,201.6 ක විචලනය හේතු දැක්වීමකින් සහ සැසඳීමකින් තොරව තිබුණි. | මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2025 දෙසැම්බර් 31 වන විට IDA ණය ශේෂය රුපියල් 40,396,376,815.82 ක් වන අතර, එය නිවැරදි බව විගණනය මගින් ද තහවුරු කර ඇත. ඇමරිකානු ඩොලර් (USD) සහ XDR මගින් දක්වා ඇති ණය ශේෂය ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ මූල්‍ය අංශය සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදල විසින් භාවිතා කරන ලද සහ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශණවලදීද භාවිතා කරන ලද 2025.12.31 දිනට අදාළ ඇමරිකානු ඩොලර් 'ස්පොට්' (SPOT) විනිමය අනුපාතිකය | XDR මගින් දක්වා ඇති ණය ශේෂයන් භාණ්ඩාගාර වාර්තා සමඟ දැනටමත් එකඟ වන බැවින්, රුපියල් බවට පරිවර්තනය කිරීම සඳහා භාවිත කරන ලද නිශ්චිත විනිමය අනුපාතිකයන් පිළිබඳව විමර්ශනය කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මහාභාණ්ඩාගාරය සමඟ යුහුසුලුව සම්බන්ධීකරණය විය යුතුය. රුපියල් අගයන්හි නිරීක්ෂණය වූ වෙනසට හේතුව හඳුනා ගැනීමට සහ ඉතා ඉක්මණින් අවශ්‍ය මූල්‍ය සංශෝධනයන් සිදු කිරීමට සවිස්තරාත්මක සැසඳීමක් සිදු කළ යුතුය. |

එනම් 309.9944 යොදා ගනිමින්, එක්සත් ජනපද ඩොලර් 130,313,247 ක IDA ණය ශේෂය පරිවර්තනය කර ඇත. කෙසේ වෙතත්, මහාභාණ්ඩාගාරයේ රුපියල් වටිනාකම් ශේෂයේ වෙනසක් පවතින අතර ඒ පිළිබඳව අපි භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත්තෙමු. ඔවුන්ගේ ප්‍රතිචාරයට අනුව, විනිමය අනුපාතිකයේ වෙනස මෙම පරතරයට බලපා ඇති අතර, ඔවුහු දැනට ඒ පිළිබඳව කටයුතු කරමින් සිටිති.